# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1890/12 - 2014 නොවැම්බර් මස 26 වැනි බදාදා - 2014.11.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978(X).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ නියමය

උසස් අධ්‍යාපන අමාත්‍ය දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මම, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුල සංස්ථාගත කරනු ලැබ ලියාපදිංචි අංක පී. වී. 62877 දරන හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඈ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව මේ නියමය මගින් සහ මෙම උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන ලද කොන්දේසිවලට යටත්ව මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති සහ ඊට අනුරූප මෙහි උපලේඛනයේ II වන තීරයේ කෙටි යෙදුම්වලින් දක්වා ඇති උපාධි පිරිනැමීම මගින් උසස් අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමි.

**උපලේඛනය**

1. (මෙහි මින්මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් උපාධි ප්‍රදානය කිරීමේ තත්වය ප්‍රදානය කළ දින සිට මාස දෙකක කාලය ඉකුත් වීමට පෙර සමාගම් ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි නිසි ලෙස සංශෝධනය කර නිශ්චිත බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

*(අ)* සමාගම් ව්‍යවස්ථාවේ පරමාර්ථයක් ලෙස උසස් අධ්‍යාපනය නිශ්චිතව සඳහන් කිරීම;

*(ආ)* සමාගම ස්වේච්ඡාවෙන් හෝ ස්වේච්ඡාවෙන් තොරව ගණන් බේරා වසා දැමීමේ දී ඒ ගණන් බේරා වසා දැමීමට පෙරාතුව නිශ්චිත බලධරයා වෙත දැනුම් දීමට පොරොන්දු වීම.

2. උපාධි පිරිනැමීමේ තත්ත්වය පිළිගැනීම සඳහා නිශ්චිත බලධරයා වෙත ඉදිරිපත් කරන දෙන ලද යම් ලේඛනයක යම් වෙනස් කිරීමක් පිළිබඳව ආයතනය විසින් නිශ්චිත බලධරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www. documents.gov. lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය ප්‍රදානය කළ දින සිට මාස තුනක් ඉකුත් වීමට පෙරාතුව ආයතනය විසින් පහත දැක්වෙන තොරතුරු නිශ්චිත බලධරයාට ඉදිරිපත් කළ යුතු ය.

(i) සුදුසුකම්ලත් අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල පත් කිරීම ඔප්පු කිරීම;
(ii) ශිෂ්‍ය විස්තර ප්‍රකාශ, පෙළ පොත් සහ ඉගෙනීමේ ද්‍රව්‍ය ලබා ගත හැකි බවට ඔප්පු කිරීම.

4. උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය ප්‍රදානය කළ දින සිට වසර තුනක් ඉකුත් වීමට පෙරාතුව ආයතනය විසින් අධ්‍යයන සඳහා පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවය සපුරාලමින් තීරක සඟරා ආදියේ පළකරන ලද පර්යේෂණ ලිපිවලට අදාළ කරුණු ඉදිරිපත් කළ යුතු ය.

මෙම නියමයේ "නිශ්චිත බලධරයා" යන්නෙන් උසස් අධ්‍යාපන විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| උපාධි පාඨමාලාව | උපාධියට අදාළ කෙටි නාමය |
| ව්‍යාපාර කළමනාකරණ විද්‍යාව පිළිබඳ උපාධිය<br>(මානව සම්පත් කළමනාකරණය) | බී.එස්.සී.බී.එම්.(HRM) |

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2014 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

12-356

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.